


දහම්සා ගිම්සරණි කීර්තිරත්න

# ගස්වැල් සුරකිමු

කතෘ : දහම්සා ගිම්සරණි කීර්තිරත්න

(මහ/මහාමායා බාලිකා විදුහල)

චිත්‍ර : දහම්සා ගිම්සරණි කීර්තිරත්න

කෘතිය පලකරන ලද දිනය: 2023.10.20

ISBN 978-624-206-693-6

# පිදුම

මාගේ සදාදරණීය දෙමාපියන්ටත් නැණ නුවන වඩවා මා නිසි මගට යොමු කළ විදුහල්පති තුමිය, ගුරු මෑණිවරුන් හා පියවරුන් වෙත ඉමහත් ගෞරවයෙන් පුදමි.

දහම්සා ගිම්සරණි කීර්තිරත්න.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුලින් ගොලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේම ගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමකුරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබු සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසුපාසල් වල දරුවන් යොමු කළ විදූහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර විදුහල් පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20

එකමත් එක කාලයක පුංචි ගමක කරුණාවන්ත පවුලක් ජීවත් වුණා. මේ පවුලේ හිටියේ අම්මයි, තාත්තයි, පුංචි දුවෙකුයි පුතෙකුයි. මේ දෙදෙනා අතරින් වැඩිමහල් දුව. ඉතින් මේ පවුල සතුටින් ජීවත් වුණා.



මේ දෙදෙනාට ගමේ කවුරුවත්ම යාළුවෝ හිටියේ නැහැ. ඒත් මේ දෙදෙනා නම් ඒවට දුක්නොවී සතුටින්

කාලය ගත කළා. පාසල් යන දවස උදා වුණා. මේ දෙදනාම උදේම නැගිටලා පාසල් යන්න සූදානම් වුණා.



ඒ අය උදෑසනම පාසලට ගොස් තම පන්තිය හා අවට පරිසරය පිරිසිදු කළා. පාසල නිම වී නිවසට ආ පසු දෙදෙනාම පිරිසිදු වී කෑම මේසයේ වාඩි වුණා.



අම්මා අක්කාගෙන් ඇහුවා අද මොනවද ඉගැන්නුවේ කියලා. අක්කා කිව්වා ගස්වැල් සුරකින්න කියලා

ගුරුතුමිය ඉගැන් වූ බව. ඉතින් ඔහොම ටික කාලයක් ගත වී ගියා. ගමට නියං කාලයක් උදා වුණා.



එය සිදු වුණේ මිනිසුන් ගස් කැපීම නිසා. ඒ වගේම එයින් මිනිසුන් හට ආහාරපාන නැතිව ගියා. ඉතින් මේ අක්කයි මල්ලියි මෙයට උපායක් සෙව්වා. ඔවුන් උපායක් හැටියට ගමේ සෑම අයෙක්ටම කිව්වා



පැළ සිටුවන ලෙස ඒත් ඔවුන් එය කිරීමට අකමැති වුණා. ඒ වුණත් මේ අක්කයි මල්ලියි නම්

එම උපාය කිරීම ආරම්භ කළා.



මේ දෙදෙනාගේ දෙමාපියෝත් එයට උදව් උපකාර කළා.

මේ අයගේ උත්සාහය දැකලා ගමේ අනෙක් අයත් එම උපාය කිරීමට කැමති වුණා. ටික දවසකින් නියඟය නැති වී ගියා. පරිසරය නැවත ගස්වැල්වලින් පිරී ගියා.



ඔවුන්ගේ උත්සාහය සාර්ථක වුණා. අක්කටයි මල්ලිටයි හරිම සතුටුයි.



නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ ම හාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඥදුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20